# රඹුක්කන ප්‍රාදේශීය සභාව

# කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුන අතර සම්ලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව රඹුක්කන ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 36,339,320 ක් වුවද, ගිණුමේ රු. 23,472,524 ක් ලෙස රු. 12,866,796 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු. 649,526 ක් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 07 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 42,490,682 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 41,091,204 ක් වූයෙන් වෙනස රු. 1,399,478 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 230,595,753 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,021,408 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 25,463,656 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 4,576 | 5,432 | 3,589 |
| (ii) බදු කුලී | 7,759 | 6,778 | 382 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,035 | 2,323 | 815 |
| (iv) වෙනත් ආදායම් | 53,409 | 16,076 | 9,208 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

---

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 444,667 |
| (ii) මුද්දර ගාස්තු | 11,807,188 |

2.3 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2011 දිවිනැගුම වැඩසටහන යටතේ යටගම කොරොස්ස වත්ත මාර්ගය හා දැලිවල තිස්ස විදුහල අසලින් මිරිහාගොඩ පාරේ අවසන් කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා සියයට 20 ක ප්‍රජාදායකත්වය හැර පිළිවෙලින් රු. 200,000 ක හා රු. 250,000 ක පිරිවැයක් යටතේ ගිවිසුම් වලට ඇතුලත් වී තිබුණි. ගිවිසුම් වල වැඩ විෂය අංක 05 අනුව සිමෙන්ති මිශ්‍රණය 1:2:3 (3/4) පරිදි පැවතිය යුතු වුවද, මිශ්‍රණයේ දුර්වලතාව නිසා ඉදි කර තිබූ කොන්ක්‍රීට් තට්ටුවේ ගල් ගැලවී තිබූ බව 2012 ඔක්තෝබර් 09 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ඉහත කර්මාන්ත දෙකෙහි කොන්ත්‍රාත් ගිවිසුම් වලට අනුව, සියයට 20 ක ප්‍රජාදායකත්වය හැර ගිවිසුම් වලට බැඳී තිබූ හෙයින් කොන්ක්‍රීට් කිරීමේ විෂයයට පමණක් ගිවිසුම්ගත මුදල ඉක්මවා රු. 25,883 ක් හා රු. 32,027 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ඉදි කිරීම් කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම් වලට ඇතුලත් වීමේදී ඇස්තමේන්තු වටිනාකමට සියයට 20 ක ප්‍රජාදායකත්වය ඇතුලත් විය යුතු වුවද, ඇස්තමේන්තු වටිනාකම රු. 8,618,740 ක් වූ 2011 දිවිනැගුම ඉදි කිරීම් කර්මාන්ත 31 ක් සඳහා ගිවිසුම් අත්සන් කිරීමේදී සියයට 20 ක ප්‍රජාදායකත්වය හැර රු. 6,894,992 ක් සඳහා පමණක් ගිවිසුම් වලට බැඳී තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පාලනය